
ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහල
SRI LANKA NATIONAL EYE HOSPITAL
www.hirunews.lk


C
E O
E D
O F C L T B
T E P O L F D Z
L P C T Z D B F E O

# 16 පාඩම - දිට්ඨ දාන

# 9 – ශ්‍රේණිය

## සිංහල භාෂාව

# 16 - පාඩම , දිට්ඨ දාන

නිපුණතාව :-.11 .0 රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි .

. නිපුණතා මට්ටම :- 11 .1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි .

# ක්‍රියාකාරකම -1

- පාඩම කියවා පහත එක් එක් වාක්‍යයේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න .

1 . සංක්ෂිප්ත ………………….. විශේෂයක් ලෙස කෙටිකතාව හැඳින්විය හැකි වේ .

i . පද්‍ය කාව්‍ය   ii . ගද්‍ය කාව්‍ය   iii . චම්පු කාව්‍ය   iv . නිසඳැස් කාව්‍ය

2 . කාලයට අනුව ඒකාබද්ධ කරන ලද සිදුවීම් සමුදාය …………….. නම් වේ .

i . කතා ප්‍රවෘත්තිය   ii . කතා වින්‍යාසය   iii . චරිත නිරූපණය   iv . දෘෂ්ටිකෝණය

3 . “ දිට්ඨ දාන ” කෙටිකතාව උපුටා ගෙන ඇත්තේ ……………………….. සඟරාවෙන් ය .

i . නුවණ   ii . මනහර   iii . සංස්කෘති   iv . කල්පනා

4 . “ දිට්ඨ දාන ” කෙටිකතාව රචකයා වන්නේ ………………………මහතා ය .

i . ජේ .සී.පී.එස් සිරිවර්ධන   ii . කේ. ජයතිලක   iii . ජී . බී . දිසානායක   iv. ගුණදාස අමරසේකර

5 . “ මීටර් සියය ” …………………….. දෘෂ්ටිකෝණයෙන් රචිත කෙටිකතාව කි .

i . ප්‍රථම පුරුෂ   ii . උත්තම පුරුෂ   iii . සර්වවේදී   iv. නාට්‍යමය

6 . “ මීටර් සියය ” කෙටිකතාවේ ප්‍රධාන චරිතය වන්නේ ………………….. ය .

i . සුගුණපාල ගුරුභවතා   ii . මහජන සෞඛ්‍ය පරීක්ෂක   iii . මුදලිහාමි   iv . විදුහල්පති












පාසල් සායනයක , අවස්ථා කිහිපයක්

# ක්‍රියාකාරකම -2

- පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න.

| අනු අංකය | පාඨය | කවුරුන් විසින් | කාහට |
|---|---|---|---|
| 1 | "අද හෙට නම් මේ ගුරු මණ්ඩලේ සොච් වමෙන් කිසි උදව්වක් දෙන්න බෑ " | | |
| 2 | " හොඳයි, ඔබතුමන්ලා කවුරුවත් මට උදව් වෙන්න් එපා " | | |
| 3 | " සර් . මට ඔය කාරියට උදව් වෙන්ට අවසර දෙන්න" | | |
| 4 | " නෑ .. මහත්තයා , ඔබතුමා නියමිත පන්තියට යන්න " | | |
| 5 | " මම මෙතනට ආවේ , ඒ ළමයින්ට අදාළ පාඩමට වුවමනා කරුණු කියා දීලයි " | | |
| 6 | " කොලුගෙ දැහැ ඔය ජේන තරම හොඳටෝ ම ඇති ආයුබෝවං " | | |
| 7 | "කෙහෙල්මල් වෛද්‍ය පරීස්සනේ … මළඉලවු වටිනාකම " | | |
| 8 | " මේ උත්තමයාගෙ රාජකාරිය එතනිං ඉවර වුනේ නෑ … " | | |
| 9 | " මම එදත් අදත් කළේ මට ලැබෙන වැටුපට නියමිත රාජකාරිය විතරයි . " | | |
| 10 | " ඕඇම්ඕත් ඉතිං අරක ම කියන්ඩ ඇති කතාව ඔච්චරයි නේ . " | | |

# ක්‍රියාකාරකම -3

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න.**

1 . කෙටිකතාව පුරාණ කතාන්දරයට නෑකම් කියයි .

2 . සත්‍ය පුවතක් පමණක් කෙටිකතාව සඳහා වස්තු විෂය වේ .

3 . කෙටිකතා නිර්මාණයේ දී ලේඛකයාට අද්දැකීම් ඉතා වැදගත් වේ .

4 . කෙටිකතාව නූතන සාහිත්‍යාංගයකි .

5 . කෙටිකතාවකින් නිරූපණය වන්නේ චරිතයකින් අංශුවක් පමණි .

6 . කෙටිකතාවට පාඨකයා හැකිතාක් දුරට සමීප කරවා ගැනීමට භාෂාව ඉවහල් වේ .

7 . කෙටිකතා තුළ ඉස්මතු වන ප්‍රබල , ප්‍රධාන චරිත ගණනාවකි .

8 . කෙටිකතාවේ අන්තර්ගත ක්‍රියාවට පිටුපසින් ඇති පරිසරය පසුබිම නම් වේ .

9 . සෑම කෙටිකතාවකට ම කතා ප්‍රවෘත්තියක් මුල් නොවේ .

10 . උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය පමණක් කෙටිකතා නිර්මාණය සඳහා යොදා ගැනේ .

# ක්‍රියාකාරකම - 4

- **පහත 'අ' කොටසේ පදයේ තේරුම ' ආ ' කොටසෙන් තෝරන්න .**

| අ | ආ |
|---|---|
| 1 .අකරතැබ්බයකට | නොපිළිගෙන බැහැර කිරීම |
| 2 . සොච්චමෙන් | ඇස් පරීක්ෂාව |
| 3 . ප්‍රතික්ෂේප | බැති සිතින් |
| 4 . නිවට නියාලු | අපහසුතාවකට |
| 5 . දෘෂ්ටි පරීක්ෂණය | ස්වල්ප දෙනාගෙන් |
| 6 . දෝෂ දර්ශනයට | ඉටුවීම |
| 7 . භක්ති පූර්වක | පිළිමයක රුවක් |
| 8 . ප්‍රතිමා රූපය | ඇස් දෙක |
| 9 . සඵල | බියසුලු බවකින් |
| 10 .දෙනුවන් | වැරදි දක්වා චෝදනා කිරීමට |

# ක්‍රියාකාරකම -5

- පහත සඳහන් පාඨවල අදහස ප්‍රකාශ වන තනි පද වරහන් තුළින්තෝරා ලියන්න .

1 . කෙටිකතාවේ අන්තර්ගත ක්‍රියාවට පිටුපසින් ඇති පරිසරය - ………………………………………

2 . සිය අද්දැකීම් නිරූපණය කිරීම පිණිස රචකයා තෝරාගන්නා  මාර්ගය - ……………………………..

3 . පොත්පත් ආදිය කියවන තැනැත්තා  -  ……………………………………………………………

4 . කාලයට අනුව ඒකාබද්ධ කරන ලද සිදුවීම් සමුදාය - ………………………………………………

5 . දෘෂ්ටි පරීක්ෂණ  සටහන් පත   -  ………………………………………………………………

(ස්නේලන් පාඨකයා පසුබිම කතා

ප්‍රවෘත්තිය දෘෂ්ටිකෝණය )

# ප්‍රායෝගික අභ්‍යාස

- පහත සඳහන් සැකිල්ලට අනුව කෙටිකතාවක් නිර්මාණය කරන්න .
- උදෑසනින් ම අවදි වූ සිරිදාස යහළුවන් තිදෙන සමඟ පෙරදින කතා කරගත් පරිදි ගමන පිටත් විය .වෙල් යාය පසු කළ ඔවුන් කුඩා වන ලැහැබකට පිවිසුණි . මේ වන ලැහැබේ වැටී තිබුණු කුඩා අඩි පාරක් දුටු ඔවුන් ඒ ඔස්සේ ගමන් කොට මද වේලාවකින් යළිත් පැමිණියේ එළිමහනකට ය . වට පිට බැලූ සිරිදාසට තරමක් ඈතින් කඳු ගැටයක් අසල පිහිටි ගල් ගුහාවක් පෙනෙන්නට විය .

.

# පිළිතුරු

## ක්‍රියාකාරකම -1

1. ගද්‍ය කාව්‍ය
2 .කතා ප්‍රවෘත්තිය
3 . සංස්කෘති
4 . ජේ .සී.පී.එස් සිරිවර්ධන
5. උත්තම පුරුෂ
6 . මුදලිහාමි

## ක්‍රියාකාරකම -2

| අ අං | කවුරුන් විසින් | කාහට |
|---|---|---|
| 1 | විදුහල්පති | මහජන සෞඛ්‍යය පරීක්ෂකට |
| 2 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | විදුහල්පතිට |
| 3 | සුගුණපාල ගුරුතුමා | මහජන සෞඛ්‍ය පරීක්ෂකට |
| 4 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සුගුණපාල ගුරුතුමාට |
| 5 | සුගුණපාල ගුරුතුමා | විදුහල්පතිට |
| 6 | සුගුණපාල ගුරුතුමා ගේ පියා | මහජන සෞඛ්‍ය පරීක්ෂකට |
| 7 | විදුහල්පති | සුගුණපාල ගුරුතුමාට |
| 8 | සුගුණපාල ගුරුතුමා | විදුහල්පතිට |
| 9 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සුගුණපාල ගුරුතුමා |
| 10 | විදුහල්පති | සුගුණපාල ගුරුතුමා ට |

## ක්‍රියාකාරකම -3

1 . √

2 . X

3 . √

4 . √

5 . √

6 . √

7 . X

8 . √

9 . X

10 . X

## ක්‍රියාකාරකම - 4

| | | |
|---|---|---|
| 1 .අකරතැබ්බයකට | - | අපහසුතාවයකට |
| 2 . සොච්චමෙන් | - | ස්වල්ප දෙනාගෙන් |
| 3 . ප්‍රතික්ෂේප | - | නොපිළිගෙන බැහැර කිරීම |
| 4 . නිවට නියාලු | - | බියසුළු බවකින් |
| 5 . දෘෂ්ටි පරීක්ෂණය | - | ඇස් පරීක්ෂාව |
| 6 . දෝෂ දර්ශනයට | - | වැරදි දක්වා චෝදනා කිරීමට |
| 7 . භක්ති පූර්වක | - | බැති සිතින් |
| 8 . ප්‍රතිමා රූපය | - | පිළිමයක රුවක් |
| 9 . සඵල | - | ඉටුවීම |
| 10 .දෙනුවන් | - | ඇස් දෙක |

❖

## ක්‍රියාකාරකම -5

1 . කෙටිකතාවේ අන්තර්ගත ක්‍රියාවට පිටුපසින් ඇති පරිසරය - පසුබිම කතා

2 . සිය අත්දැකීම් නිරූපණය කිරීම පිණිස රචකයා තෝරාගනු ලබන මාර්ගය - දෘෂ්ටිකෝණය

3 . පොත්පත් ආදිය කියවන තැනැත්තා - පාඨකයා

4 . කාලයට අනුව ඒකාබද්ධ කරන ලද සිදුවීම් සමුදාය - ප්‍රවෘත්තිය

5 . දෘෂ්ටි පරීක්ෂණ සටහන් පත - ස්නේලන්